ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2020.08.26** ***චක්‍රලේඛ අංක : 25 /2020***

**දිසා බාලදක්ෂ කොමසාරිස් තුමා මගින්**
**පුහුණු කිරීමේ අංශය භාර සහය දිසා කොමසාරිස් වෙත,**

**මහත්මයාණනි/මහත්මියනි,**

**පුහුණු කිරීමේ අංශය භාර සහාය දිසා කොමසාරිස්වරුන්ගේ සම්මන්ත්‍රණය**
**2020 සැප්තැම්බර් මස 19 වන සෙනසුරාදා දින පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා**
**සම්පත් බැංකු මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී**

**පුහුණු කිරීමේ අංශය භාර සහය දිසා කොමසාරිස්වරුන්ගේ සම්මන්ත්‍රණය 2020 සැප්තැම්බර් මස 19 වන සෙනසුරාදා දින පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා සම්පත් බැංකු මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී (කොළඹ 02 නවලෝක රෝහල ඉදිරිපිට) පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම රැස්වීමේ දී පහත සඳහන් අංශ පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරේ.**

1. **පුහුණු කිරීමේ අංශය තුළින් 2020/2021 දී සංඛ්‍යාත්මකව හා ගුණාත්මකව අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට දිස්ත්‍රික්කය සංවිධානය කිරීම.**
2. **පළමු අදියරේ සිට බාලදක්ෂ ආචාර්ය පුහුණු වැඩසටහන් ක්‍රමවත් ව පවත්වාගෙන යාම හා ඇගයීම.**
3. **පුහුණු කිරීමේ කටයුතු පිළිබඳ දිසාවේ දත්ත ජාතික බාලදක්ෂ මූලස්ථානයට ලබා ගැනීම.**

**බාලදක්ෂ ව්‍යාපාරයේ සුවිශේෂී කාර්යභාරයක් ඔබ දිස්ත්‍රික්කයේ පුහුණු කිරීමේ අංශය වෙත පැවරී ඇති බැවින්, ඉහත රැස්වීම සඳහා සහාය දිසා කොමසාරිස් (පුහුණු) ගේ සහභාගීත්වය අත්‍යාවශ්‍ය බව සලකන්න. එහෙත් දැනට එම ධූරය ඔබ දිසාවේ පුරප්පාඩුව පවතී නම්, එම වගකීම් ඉටු කළ හැකි සුදුසු පුද්ගලයෙකු නොපමාව පත් කර උක්ත සම්මන්ත්‍රණය සඳහා සහභාගී කරවීමට කාරුණික වන්න.**

**මේ සමග අමුණා ඇති පිළිතුරු පත නිසි පරිදි පුරවා, 2020 සැප්තැම්බර් මස 10 වන දිනට පෙර ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, අංක. 65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට හෝ** slscout1@yahoo.com **යන විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.**

**මෙම කාර්යයේ දී ඔබගෙන් ලැබෙන සහය වෙසෙසින් අගය කරමු.**

**මෙයට,**
**බාලදක්ෂ සේවයේ නියුතු,**

***නන්ද ප්‍රනාන්දු***
**ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්**

**පිටපත් :-**

1. **ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් තුමා**
2. **නියෝජ්‍ය ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් තුමා**
3. **ජාතික වැඩසටහන් කොමසාරිස් තුමා**
4. **ජාත්‍යන්තර කොමසාරිස් තුමා**
5. **සියළුම සහාය ප්‍රධාන කොමසාරිස් හා විශේෂ කොමසාරිස් වරුන්**

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: srilankascouts@ymail.com
Web : Srilankascouts.lk